(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 5(3).]

# පාර්ලිමේන්තුවේ අංක 5 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2017 ජනවාරි මස 09 වැනි සඳුදා**

---

## 2017 ජනවාරි මස 24 වැනි අඟහරුවාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 164 වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 237 වගන්තිය යටතේ මෝටර් වාහන (සලකුණු, සංඥා, සංකේත හා මාර්ග ලකුණු කිරීම්) සම්බන්ධයෙන් ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 නොවැම්බර් 12 දිනැති අංක 1940/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2016 ඔක්තෝබර් 03 දිනැති අංක 1987/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2016 නොවැම්බර් 10 දිනැති අංක 1992/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මුදල් අමාත්‍යතුමා,— ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත යටතේ නියමය,—2014 අංක 38 දරන ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනතේ 3(2) වගන්තිය ප්‍රකාරව, ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් වන සී/ස ඇවික් ඉන්ටනැෂනල් හොටෙල්ස් ලංකා සමාගමට කොල්ලුපිටියේ පිහිටි ඉඩමක් සින්නක්කරව පැවරීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2016 නොවැම්බර් 08 දිනැති අංක 1992/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2017.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගය ලබාදීම පනත යටතේ නියමය,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ යුක්රේනයේ ආණ්ඩුව අතර සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය නෛතික සහයෝගය ලබාදීම පිළිබඳව ඇතිකර ගනු ලැබූ ගිවිසුම සම්බන්ධයෙන් 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනතේ 2 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් පනවනු ලදුව, 2016 නොවැම්බර් 11 දිනැති අංක 1992/78 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.01.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***